# මතුගම අධ්‍යාපන කලාපය

## දෙවන වාර පරීක්ෂණය - 2018

**10 ශ්‍රේණිය** | **නාට්‍ය හා රංග කලාව - I** | **කාලය : පැය 01**

නම ..............................................................................................................................................

**සැලකිය යුතුයි**

- සියළුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක 1-40 තෙක් දී ඇති (1) (2) (3) (4) පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරා ඔබට සැපයෙන උත්තර පත්‍රයේ නියමිත ප්‍රශ්න අංකයට හිමි උත්තරයෙහි අංකය හා සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න. මුළු ලකුණු (40×1) 40 යි.

---

* **පහත දී ඇති ශාන්ති කර්ම ඇසුරෙන් 1-5 දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

A රටයැකුම B කොහොඹා කංකාරිය C සොකරි

D සන්නියකුම E සූනියම්යාගය F කෝළම්

(1) පහත රට සම්ප්‍රදායට අයත් ශාන්ති කර්ම වන්නේ

(1) A B C (2) A C D (3) A D E (4) B D F

(2) නානුමුරය නාට්‍යමය පෙළපාලිය අයත් ශාන්ති කර්මය

(1) A (2) D (3) E (4) F

(3) වඩිඟපටුන නම් නාට්‍යමය පෙළපාලිය අයත් ශාන්ති කර්මය

(1) A (2) C (3) D (4) E

(4) දහ අට සන්නිය නම් නාට්‍යමය පෙළපාලිය අයත් ශාන්ති කර්මය

(1) A (2) D (3) E (4) F

(5) කාන්තාවන් වෙනුවෙන් පවත්වන ශාන්ති කර්මය වන්නේ

(1) A (2) B (3) C (4) E

* **පහත දී ඇති නාට්‍ය ගීත කොටස් ඇසුරෙන් 6-9 දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

ᴬ රතදර සිරියා පරදන
රූපෙට වටිනා නිමල කොමල තරුණී

B දීකිර දීකිරි ගෙනාව දීකිරි
මිහිපිට කාටාත් ගුණ දෙන දී කිරි

C සෝභාව දේ මෙපුර සිරි විසුතුරු
බලනු මිතුරු මග පියකරුවූ

D ඇහල මලින් ගස් පිරිලා
බලන්න හරි ලස්සනයි

(6) රතු හැට්ටකාරී නාට්‍යයට අයත් ගීත ඛණ්ඩය

(1) A (2) B (3) C (4) D

(7) ක වලින් දැක්වෙන ගීත ඛණ්ඩය ඇතුළත් වන නාට්‍යය

(1) තාරාවෝ ඉගිලෙති (2) මීපුර වැසියෝ

(3) රාජකපුරු (4) නරි බෑණා

(8) නාඩගම් ශෛලියට අයත් ගීත ඛණ්ඩය වන්නේ

(1) A (2) B (3) C (4) D

(9) දයානන්ද ගුණවර්ධනයන්ගේ නාට්‍යය ගීතයක් වන්නේ

(1) A (2) B (3) C (4) D

(10) පහසුවෙන් සිටගෙන හොඳින් හුස්මගෙන උදරය පුරවා ස්වල්ප වේලාවක් රඳවා තබාගෙන ක්‍රමයෙන් මුවින් ආ / ඕ/ ලා වැනි හඬ නිකුත් කරමින් හුස්ම පිටකරමින් කරනු ලබන අභ්‍යාසය

(1) රංග ක්‍රීඩාවකි (2) ශිථිලකරණ අභ්‍යාසයකි

(3) කටහඬ පුහුණු අභ්‍යාසයකි (4) චිත්ත ඒකාග්‍රතාව ඇති කරන අභ්‍යාසයකි

(11) නාට්‍යමය අවස්ථාවක් යනු

(1) කිසියම් ජනකතාවක අවස්ථාවක්

(2) අද්දැකීම් පදනම් කරගෙන ප්‍රබන්ධ කරපු අවස්ථාවක්

(3) ක්ෂණික නිරූපණ අවස්ථාවක්

(4) කිසියම් ගැටළුකාරී කුතුහලයෙකින් යුත් අවස්ථාවක්

(12) පන්ති කාමරයේදී වෙනස් වූ ගමන් තාලයකට පාලමක් උඩින් ඇවිද ගෙන යාමේ ක්‍රියාකාරකම මගින් සිදුකරන ලද්දේ

(1) ස්වාභාවික චලනයකි (2) නිර්මිත චලනයකි

(3) රිද්මයානු කූල චලනයකි (4) තාලානුකූල චලනයකි

(13) සාත්වික ආහාර්ය ආංගික අභිනය යන අංග තුන ප්‍රධාන වන අංගය වන්නේ

(1) ලී කෙළි නැටුම් (2) සවරං නැටුම් (3) භරත නැටුම් (4) කළගෙඩි නැටුම්

* **14 - 15දක්වා ප්‍රශ්නවල නොගැලපෙන පිළිතුර තෝරන්න.**

(14) ක්ෂණික නිරූපණ සම්බන්ධයෙන් නිවැරදි නොවන ප්‍රකාශය තෝරන්න

(1) ක්ෂණික නිරූපණයක් තනිව හෝ සාමූහිකව ඉදිරිපත් කරන්නකි

(2) ක්ෂණික නිරූපණයක නාට්‍යමය අවස්ථාවක් තිබිය යුතුය

(3) ක්ෂණික නිරූපණයක් පිටපතක් සහිතව සිදු කෙරෙන්නකි

(4) සාර්ථක ක්ෂණික නිරූපණයකට පරිකල්පන ශක්තිය අවශ්‍යය

(15) රංග ක්‍රීඩා මගින්

(1) සාමූහිකත්වය වර්ධනය වෙයි (2) අවධානය පිළබඳ හැකියාවන් වර්ධනය වෙයි

(4) සබකෝළය ඇති වෙයි (3) ජය පරාජය විඳ ගැනීමේ හැකියාව වර්ධනය වෙයි

* **පහත දක්වා තිබෙන දෘෂ්‍ය හා ප්‍රාසාංගික කලා මාධ්‍ය ඇසුරෙන් 16 -20 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු ලබා දෙන්න.**

A කැටයම් B චිත්‍රපට C නාට්‍යය D මුද්‍රා නාට්‍ය E ඔපෙරා

(16) දෘෂ්‍යකලා මාධ්‍යයට අයත් වන්නේ

(1) A (2) B (3) C (4) D

(17) එකම වේලාවක ස්ථාන කීපයකම ප්‍රදර්ශනය කළ හැකි ශ්‍රව්‍ය දෘෂ්‍ය කලා මාධ්‍ය

(1) A (2) B (3) C (4) D

(18) ආංගික හා සාත්වික අභිනය මූලිකවන කලා මාධ්‍ය වන්නේ

(1) A (2) C (3) D (4) E

(19) සංගීතය හා ගායනය ප්‍රධාන කොට පවත්නා කලා මාධ්‍ය වන්නේ

(1) B (2) C (3) D (4) E

(20) සතර අභිනයම සහිත සජීවී කලා මාධ්‍ය වන්නේ

(1) A (2) C (3) D (4) E

*    **පහත දක්වා ඇති ඡායා රූප ඇසුරෙන් 21-25 දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

   

1 2 3 4

(21) මනමේ නාට්‍යයේ දනුද්ධර කුමරුගේ චරිතය තුළින් ප්‍රේක්ෂක හදවත් දිනා ගත් සිනමාවේද ටෙලි නාට්‍යවලදූ, රංගන ශිල්පියෙකු ලෙස ප්‍රකට වූ ශිල්පියාගේ ගේ රුව ඉහත ඡායා රූප අතර දිස් වේ ඔහු නම්

(1) ගාමිණී සමරකෝන්ය (2) සනත් විමලවීරය

(3) විජේරත්න වරකාගොඩය (4) විජය න්දසිරිය

(22) දීර්ග කාලයක් එකම චරිතයකට පන පොවමින් ජනප්‍රිය වූ රංගන ශිල්පිනියකගේ රුවක් ඉහත රූප වලින් පෙන්නුම් කෙරේ ඇය නම්

(1) මාලනී රණසිංහ (2) මැණකේ අත්තනායක

(3) මානෙල් ජයසේන (4) අනුලා බුලත්සිංහල

(23) එලෙස දීර්ග කාලයක් රඟපාන ලද චරිතය වන්නේ

(1) මනමේ කුමරියගේ චරිතයයි (2) සුප්පා දේවියගේ චරියයි

(3) දික්තලාගේ චරිතයයි (4) ගෘෂාගේ චරිතයයි

(24) රතු හැට්ටකාරී නාට්‍යයේ රංගන ශිල්පිනියක ලෙසත් එහි ගීයකින් ද නොමැකෙන සටහනක් ප්‍රේක්ෂක හදවත් තුළ රඳවන ලද ශිල්පිනියකගේ රුවක් ඉහත ඡායා රූප අතර පෙන්නුම් කෙරේ ඇය නම්,

(1) මැණතේ අත්තනායක (2) අනුලා බුලත්සිංහල

(3) මර්ෂි එදිරිසිංහ (3) මානෙල් ජයසේන

(25) මෑතකදී පවත්වන ලද සිනමා උළෙලකදී  සම්මානයෙන් පිදුම් ලැබූ රංගන හිල්පියෙකුගේ රුවක් ඉහත ඡායා රූප අකර දිස් වේ ඔහු නම්,

(1) සුමින්ද සිරිසේන (2) විජේරත්න වරකාගොඩ

(3) විජය න්දසිරි (4) ශ්‍රියන්ත මෙන්ඩිස්

(26) ඉහත ඡායා රූප A B C D පිළිවෙලට ගැලපුවිට නිවැරදි පිළිතුර වන්නේ,

(1) සුමින්ද සිරි සේන, මැණකේ අත්තනායක, ශ්‍රියන්ත මෙන්ඩිස්, මර්ෂි එදිරිසිංහ

(2) විජය න්දසිරි, අනුලා බුලත්සිංහල ,විජේරත්න වරකාගොඩ, මානෙල් ජයසේන

(3) විජේරත්න වරකාගොඩ, මානෙල් ජයසේන, විජය න්දසිරි, අනුලා බුලත්සිංහල

(4) විජේරත්න වරකාගොඩ, අනුලා බුලත්සිංහල , විජය න්දසිරි, මර්ෂි එදිරිසිංහ

*    **පහත දක්වා ඇති ඡායා රූප ඇසුරෙන් 27-31 දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

   

ᵖ ඊ ඣ ə

(27) ලෝක ධර්මී නාට්‍ය නිෂ්පාදනය ආරම්භ කළ ප්‍රමුඛයාගේ ඡායාරූපය දැක්වෙන්නේ,
(1) A වලිනි (2) B වලිනි (3) C වලිනි (4) D වලිනි

(28) "හනික වරෙව් කොල්ලනේ
මෙන්න මෙහෙ වරෙව්''
යන ගීත ඛණ්ඩය ඇතුළත් ජනප්‍රිය අනුවර්තන නාට්‍යය අධ්‍යක්ෂවරයාගේ රුව දැක්වෙන්නේ,
(1) Aවලිනි (2) B වලිනි (3) C වලිනි (4) D වලිනි

(29) ප්‍රකට කෙටිකතා සහ නවකතා කරුවෙකු මෙන්ම චිත්‍රපට නළුවෙකු වශයෙන්ද ප්‍රසිද්ධියක් ඉසුලූ ස්වතන්ත්‍ර නාට්‍ය රචකයෙකු වූ නිර්මාණකරුගේ රුව දැක්වෙන්නේ,
(1) A වලිනි (2) B වලිනි (3) C වලිනි (4) D වලිනි

(30) ණීදෙයක් වේනම් යම්සුදුස්සාටම අයිති විය යුතු""
යන තේමාව මුල් කර ගෙන නිර්මාණය වූ අනුවර්තන නාට්‍යයේ රචකයා දැක්වෙන්නේ,
(1) A වලිනි (2) B වලිනි (3) C වලිනි (4) D වලිනි

(31) ඉහත ඡායාරූප වලින් දක්වා තිබෙන නාට්‍යකරුවන්ගේ ඡායා රූප පිළිවෙලින් A B C D වශයෙන් ගැලපුවිට නිවැරදි පිළිතුර වන්නේ,
(1) සයිමන් නවගත්තේගම, බන්දුල ජයවර්ධන, සුගතපාල ද සිල්වා, හෙන්රි ජයසේන
(2) හෙන්රි ජයසේන බන්දුල ජයවර්ධන, සුගතපාල ද සිල්වා, , සයිමන් නවගත්තේගම
(3) බන්දුල ජයවර්ධන, සුගතපාල ද සිල්වා, හෙන්රි ජයසේන, සයිමන් නවගත්තේගම
(4) හෙන්රි ජයසේන, සයිමන් නවගත්තේගම, බන්දුල ජයවර්ධන, සුගතපාල ද සිල්වා,

*** පහත දී ඇති පද අතරින් නිවැරදි පද තෝරා පහත වගුව නිවැරදිව සම්පූර්ණ සපයන්න.**

ඇලෙක්සැන්ඩර් බ්‍රෝම්, ටෙනසි විලියම්, බර්ටෝල්ට් බ්‍රෙෂ්ට්, ද කැට් ඔන් අ හොට් ටින්රූෆ්, ඉර්මා ලාඩුෂ්, දිරිය මව සහ ඇගේ දරුවෝ, මුතු කුමාරි, හෙන්රි ජයසේන, සුගතපා ද සිල්වා

| මුල් කෘතියේ නම | මුල් කෘතිය රචකයාගේ නම | නාට්‍ය නිර්මාණයේ නම | දේශීය නිෂ්පාදක |
|---|---|---|---|
| මදර් කරේජ් | (32)-------------------- | (33)----------------- | හෙන්රි ජයසේන |
| (34)-------------- | (35)-------------------- | (36)----------------- | සුගතපා ද සිල්වා |
| (37)--------------- | ටෙනසි විලියම් | හෙලේ නැග්ග ඩෝංපුතා | (38)---------- |



(39) ඉහත ඡායා රූපයෙන් දැක්වෙන නාට්‍යය කුමක්ද ?
(1) නරිබෑණා (2) දික්තල කාලගෝල (3) එලොව ගිහින් මෙලොව ආව (4) කදා වළලු

(40) එහි දැක්වෙන චරිත වන්නේ
(1) ගම මහගේ සහ ගමරාළ (2) කළුඅප්පු සහ කළුහාමි
(3) සේරි වානිජ හා සිටු දියණිය (4) කාළගෝල සහ දික්තලා

දෙවන වාර පරීක්ෂණය* 2018

මතුගම අධ්‍යාපන කලාපය

| | | |
|---|---|---|
| නාට්‍ය හා රංග කලාව ii | 10 | කාලය පැය 02 යි |

නම -------------------------------------- පන්තිය -------

සැලකිය යුතුයි

- පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න 4ක් ඇතුළු ප්‍රශ්න 5කට කට පිළිතුරු සපයන්න.

---

අපි ගමට යමු ගමට යමු //
බිරිඳ බලන්න මගේ නෑදෑයෝ
ඉලව්වේ මාගේ පැහිච්ච ගෑණී''

1 (1) මේ ගීත කොටස ඇතුළත් නාට්‍යය කුමක්ද? (ලකුණු 01යි)

(2) මේ ගීත කොටස ගයන්නේ  කවුද?  (ලකුණු 01යි)

(3) මෙම නාට්‍යයට පාදක වූ කතා වස්තුව ඇතුළත් මුල් කතාපුවත කුමක්ද?  (ලකුණු 01යි)

(4) මේ අවස්ථාවේ වේදිකාවේ සිටින අනිත් චරිතය කවුද?  (ලකුණු 01යි)

(5) මෙම නාට්‍යයේ මුල් රචකයා නම් කරන්න  (ලකුණු 02යි)

(6) මෙම නාට්‍යයේ  නාට්‍ය ශෛලිය නම් කරන්න  (ලකුණු 02යි)

(6) මෙම නාට්‍ය ශෛලියේ ලක්‍ෂණ දෙකක්  සඳහන්  කරන්න  (ලකුණු 02යි)

(7) මෙම නාට්‍යයේ ගැටුම් අවස්ථා දෙකක් සඳහන්  කරන්න  (ලකුණු 02යි)

2 (1) අංග රචනයේ මූලික කොටස් දෙක නම් කරන්න  (ලකුණු 02යි)

(2) අංග රචනයේදී භාවිතයට ගන්නා අමු ද්‍රව්‍ය හතරක් නම් කරන්න  (ලකුණු 04යි)

(3) අංග රචනයේදී වැදගත් වන කරුණු දෙකක් දක්වා විස්තර කරන්න  (ලකුණු 06යි)

3 (1) රංග අභ්‍යාස යනු කුමක්ද?  (ලකුණු 02යි)

(2) රංග අභ්‍යාස වර්ග හතරක් නම් කරන්න  (ලකුණු 4යි)

(3) ඔබ සඳහන් කරක ලද එක් වර්ගයකට අයත් අභ්‍යාසයක් සිදුකරන ආකාරය පැහැදිලි කරන්න  (ලකුණු 6යි)

4 (1) වේදිකා නාටයයක සුවිශේෂී බව පෙන්නු කරන ලක්ෂණ දෙකක් දක්වන්න(ලකුණු 02යි)

(2) වේදිකා නාටයයක භාවිතා කරන ආනුෂංගික අංග හතරක් නම් කරන්න (ලකුණු 4යි)

(3) නාට්‍යය යනු සාමූහික ප්‍රයත්නයක යහපත්වූ ප්‍රතිඵලයකි යන්න විමසීමට ලක් කරන්න (ලකුණු 6යි)

5 (1) ශ්‍රී ලංකාවේ නාටය කලාවේ ප්‍රගමනයට දායක වූ නාටය කරුවන් දෙදෙනෙක් නම් කරන්න (ලකුණු 02යි)

(2) ඔවුන් දෙදෙනාගේ නාට්‍ය නිර්මාණ තුනක් වෙන්වෙන්ව ලියන්න (ලකුණු 4යි)

(3) ඔබ සඳහන් කරක ලද එක් නාට්‍යකරුවෙකුගේ නාටය වල ඇති විශේෂ ලක්ෂණ පිලිබඳ විස්තර කරන්න (ලකුණු 6යි)

6 (1) පහත රට සම්ප්‍රදායේ ශාන්ති කර්ම දෙකක් නම් කරන්න (ලකුණු 2යි)

(2) ඔබ සඳහන් කරන ලද ශාන්ති කර්ම වල දක්නට ලැබෙන නාට්‍යමය අවස්ථා නම් කරන්න (ලකුණු 4යි)

(3) ශාන්ති කර්මයකින් නාට්‍යයක් වෙනස් වන ලක්ෂණ විස්තර කරන්න (ලකුණු 6යි)